## 1.34. 1900 ට පෙර ලක්දිව ඡායාරූප ශිල්ප ව්‍යවහාරය හඳුනාගැනීම

- උදිත ගයාෂාන් ගුණසේකර
නාට්‍ය හා රංග කලා සහ ප්‍රතිබිම්බ කලා අධ්‍යයන ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

දහනව වන සියවසේ මුල් භාගයේ හඳුනාගත් ඡායාරූප ශිල්ප තාක්ෂණය ලක්දිවට සම්ප්‍රාප්ත වූ අවධිය නිර්ණය කිරීමේ ද, එවක පටන් එම සියවසේ අවසානය තෙක් ශ්‍රී ලංකාවේ ඡායාරූප විෂයය භාවිත වූ ආකාරය හඳුනාගැනීමේ අරමුණින්, මෙම අධ්‍යයනය ක්‍රියාවට නගනු ලැබීය. එහි දී පහත සඳහන් ගැටලු කේන්ද්‍ර කොටගෙන තොරතුරු රැස්කිරීම, විමර්ශනය කිරීම සිදුකරන ලදි.


- ශ්‍රී ලංකාවට ඡායාරූප ශිල්පය සම්ප්‍රාප්ත වූයේ කවර අරමුණක් පෙරදැරි කොටගෙන දැයි විමර්ෂණය කර හෙළිදරව් කිරීම.
- ලංකාවේ මුල් ම ඡායාරූප ශිල්ප ව්‍යවහාරය සහ එහි අභිප්‍රාය පිළිබඳ නිවැරදි ව නිර්ණය කිරීම.
- ඡායාරූප ශිල්පය පිළිබඳ තත්කාලීන සමාජ ආකල්පය විග්‍රහ කිරීම.
- ඡායාරූප ශිල්පය හා සම්බන්ධ ස්වදේශික දායකත්වය හඳුනාගැනීම.

යථෝක්ත විමර්ශනය හා අදාළ තොරතුරු සඳහා ග්‍රන්ථමය මූලාශ්‍ර, කෞතුකාගාර හා ලේඛනාගාර සුරැකුම්, ආයතනගත තොරතුරු, පුද්ගල සම්මුඛ සාකච්ඡා පාදක කර ගැනිණි. සපයාගත් දත්ත විමර්ශනයෙන් පසු අනාවරණය කරගත් තොරතුරු පහත සඳහන් වේ.

- ඡායාරූප ශිල්පය මෙරටට සේන්දු වී ඇත්තේ විනෝදාශයක් වශයෙනි. එහෙත් එය ව්‍යාපාරික වශයෙන් ස්ථාවර වූයේ අධිරාජ්‍යවාදී දේශපාලන අවශ්‍යතාව මුල්කර ගනිමිනි.
- එෆ්.ජේ. බැරෝ නැමැත්තෙක් 1844 දී කොළඹ කොටුව, බේලි වීදියේ අංක 04 දරන ස්ථානයේ ප්‍රථම ඡායාරූප චිත්‍රාගාරය ආරම්භ කර ඇත. එය මුළුමනින් ම, මෙහි පදිංචි ව සිටි ස්වදේශිකයන්ගේ සහ කොළඹ වරායෙන් රටට ගොඩබසින සංචාරකයන්ගේ අවශ්‍යතාව මත පවත්වාගෙන යනු ලැබූවකි.
- ඡායාරූප ශිල්පය මෙරට පදිංචි ව සිටි විදේශිකයින්ගේ අවශ්‍යතාව සහ හිතසුව පිණිස පවත්වාගෙන යනු ලැබූවකි. එහි මූලික අභිප්‍රායන් දෙකක් හඳුනාගත හැකි විය.

  i. පුද්ගල මානසිකත්වය යහපත් ලෙස පවත්වාගැනීමට ආධාර වීම.
  ii. අධිරාජ්‍ය ගැති මානසිකත්වය ස්වදේශිකයන් තුළ ස්ථාපනය සහ වර්ධනය කිරීම.

මෙම අභිප්‍රායයන් ට යටත් ව සිදු වූ ඡායාරූප ශිල්ප ක්‍රියාකාරකම් මතු දැක්වෙන සේ හඳුනාගත හැකි විය. එහෙයින් ඡායාරූප ශිල්පය යනු "පාලකයින්ගේ මාධ්‍යයක්" ලෙස ආකල්පගත විය.




- 1900 ට පෙර වකවානුවේ ඡායාරූප ශිල්පයේ නියැලුනු අය මූලික ප්‍රභේද දෙකකට වර්ගීකරණය කළ හැකි විය.

    i. වෘත්තීය ඡායාරූප ශිල්පීන් සහ ආයතන
    ii. වෘත්තීය නොවන ඡායාරූප ශිල්පීන්

මේ දෙකොටසට අදාළ ව ශිල්පීන් 75 දෙනෙකු පමණක් ද, ආයතන 22 ක් පමණක් ද හඳුනාගත හැකි විය. ඉහත පුද්ගලයින් අතර ස්වදේශිකයන් සංඛ්‍යාව එක් අයෙකුට සීමා වූ අතර, කිසිදු ඡායාරූප ශිල්ප ව්‍යාපාරයක් ස්වදේශිකයන් සතු නොවිණි.

මේ අනුව 19 වන සියවසේ ඡායාරූප ශිල්පය යනු බහුල වශයෙන් භාවිත වී ඇත්තේ විජාතික පාලකයින්ගේ ආර්ථික සුබසාධනය, දේශපාලන ස්ථාවරත්වය, පරිපාලන සම්බන්ධීකරණය හා මානසික සංතෘප්තිය උදෙසා පවත්වාගෙන ගිය බව නිගමනය කළ හැකි විය.